**ගුදම් කුවිතාන්සි මූල්‍යයන ව්‍යාපෘතිය - 2015**

ගුදම් කුවිතාන්සි මූල්‍යයන ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංසං) අතර 2012 ජූලි 17 දින එළඹි අංක ටීඑෆ් 6138 (ටීඑෆ් 012186) දරන ප්‍රදාන ගිවිසුමේ 2 උපලේඛනයේ II ආ 3 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ගුදම් කුවිතාන්සි මූල්‍යයන ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වර්තමානයේ මුදල් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, දේශීය ගොවීන්ට ඔවුන්ගේ කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා තත්ත්වයෙන් උසස් ගබඩා පහසුකම් සඳහා ප්‍රවේශය සැපයීම සහ ඉලෙක්ට්‍රොනික ක්‍රම මඟින් ගනුදෙනු කළ හැකි ගුදම් කුවිතාන්සි මූල්‍යයන වැඩසටහනක් සංවර්ධනය කිරීම මඟින් අතිරේක ඇප ලෙස මූල්‍ය සේවා ප්‍රවේශය සඳහා එවැනි නිෂ්පාදන යොදා ගැනීමේ පහසුකම් ලබා ගැනීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 852.8 කට සමාන එජඩො මිලියන 6.5 ක් වූ අතර ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2012 ජූලි 17 දින ආරම්භ කරන ලද අතර 2015 ජූලි 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඇ) ප්‍රදාන ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2015 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරනලද ප්‍රතිපාදනය | උපයෝජනය කළ අරමුදල් | | |
|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාසංසං | 6.5 | 852.8 | 442 | 132 | 4.7 | 612 |
| | 6.5 | 852.8 | 442 | 132 | 4.7 | 612 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරු අනුව, රු.මිලියන 852.8 කට සමාන එජඩො මිලියන 6.5 ක මුළු වෙන්කිරීමෙන්, රු.මිලියන 612 කට සමාන එජඩො මිලියන 4.7 ක් පමණක් ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසානයට උපයෝජනය කර තිබුණි.

(ආ) ලොකු ලූනු ගුදම් ඉදිකිරීම සඳහා ගොවීන්ට සහාය වීමට ප්‍රදාන ගිවිසුමේ කරන ලද රු.මිලියන 78.72 කට සමාන එජඩො 600,000 මුළු වෙන්කිරීමෙන් රු.මිලියන 48.58 කට සමාන එජඩො 370,320 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ඇ) ලැබුණු තොරතුරු අනුව, එජඩො මිලියන 1.68 ක වැය නොකළ ප්‍රදාන මුදල් ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසානයේදී ආපසු යවා තිබුණි. තවද මන්නාරම හි විශාල ගුදම ඉදිකිරීම සඳහා ප්‍රදානය කරන ලද රු.මිලියන 184 ක් වූ මුළු කොන්ත්‍රාත් පිරිවැයෙන් රු.මිලියන 73.76 ක මුදලක් පමණක් ප්‍රතිපූර්ණය කර තිබුණි. එබැවින් ගුදම ඉදිකිරීමේ ඉතිරි වැඩවල පිරිවැය ශ්‍රී ලංකා රජය විසින් දරනු ඇත.

**3.2 භෞතික ප්‍රගතිය**

---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබුණු තොරතුරු අනුව, ගුදම් කුවිතාන්සි ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා හුරුළුවැව, බුත්තල සහ මන්නාරම ප්‍රදේශවල විශාල ගුදම් 03 ක් ඉදිකිරීමට ව්‍යාපෘතිය කටයුතු කර තිබුණු අතර ඒවායින් හුරුළු වැව හා බුත්තල ගුදම්වල ඉදිකිරීම් වැඩ නිම කර පිළිවෙලින් 2015 මාර්තු හා සැප්තැම්බර් මාසවල භාර දී තිබුණි. මෙට්‍රික් ටොන් 5,000 ක් බැගින් ධාරිතාවයන් ඇති හුරුළු වැව හා බුත්තල ගුදම්වල ගොවීන්ගේ නිෂ්පාදන ගබඩා කිරීම 2015 මාර්තු 31 දින හා 2016 ජනවාරි 31 දින ආරම්භ කර තිබුණි. කෙසේ වුවද, 2016 මැයි 31 දක්වා මෙට්රික් ටොන් 314 ක් හා මෙට්රික් ටොන් 230 ක් වූ ධාන්‍ය පමණක් පිළිවෙලින් හුරුළු වැව හා බුත්තල ගුදම්වල ගබඩා කර තිබුණි. මන්නාරම ගුදම් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව 2015 මැයි 11 දින ප්‍රදානය කර තිබූ අතර 2015 දෙසැම්බර් 31 දිනට වැඩවලින් සියයට 40 ක් පමණක් නිම කර තිබුණි.

(ආ) තවද ලොකු ලූනු වගා කිරීමේ නිරත ගොවීන්ට ස්වකීය ගුදම් ඉදිකර ගැනීම සඳහා මූල්‍ය හා තාක්ෂණික සහාය ව්‍යාපෘතිය විසින් සපයා තිබුණි. එබැවින් මාතලේ දිස්ත්‍රික්කයේ ගුදම් 500 ක් ඇතුළත්ව ගුදම් 600 ක් ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ ඉදිකිරීමට අපේක්ෂා කර තිබුණි. ලැබුණු තොරතුරු අනුව, මාතලේ දිස්ත්‍රික්කයේ ගොවීන් 143 ක් ඇතුළත්ව ගොවීන් 352 දෙනෙකු 2015 දෙසැම්බර් 31 දිනට ස්වකීය ලොකු ලූනු ගුදම්වල ඉදිකිරීම් වැඩ සම්පූර්ණ කර තිබුණි.

(ඇ) ව්‍යාපෘති ලියකියවිලි අනුව, ණය ගනුදෙනු කටයුතු සඳහා ඉලෙක්ට්‍රොනික යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම මඟින් වාණිජ බැංකුවලින් ණය ලබා ගැනීමට අතිරේක ඇප ලෙස ගොවීන්ගේ නිෂ්පාදන යොදා ගැනීම සඳහා ගොවීන්ට පහසුකම් සැපයීමට යෝජනා කර තිබුණි. කෙසේ වුවද හුරුළු වැව හා බුත්තල ගුදම්වල ගබඩා පහසුකම් ලබාගත් පිළිවෙලින් ගොවීන් 70 ක් හා 16 දෙනෙකු සඳහා පමණක් ඉලෙක්ට්‍රොනික යාන්ත්‍රණයක් මඟින් ණය පහසුකම් ලබා ගැනීම සඳහා පහසුකම් සැපයීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට හැකි වී තිබුණි. මන්නාරම ගුදම් ඉදිකිරීම් වැඩ නිමකිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් මන්නාරම දිස්ත්‍රික්කයේ ගොවීන් සඳහා ඉලෙක්ට්‍රොනික කුවිතාන්සි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඈ) බුත්තල විශාල ගුදම මොණරාගල දිස්ත්‍රික්කයේ කෙළවරක ස්ථානගතව තිබූ අතර, කුඹුරේ සිට ගුදම දක්වා විශාල ප්‍රවාහන පිරිවැයක් දැරීමට සිදුවීම හේතුවෙන් සියඹලාණ්ඩුව, මඩුල්ල, බඩල්කුඹුර, මැදගම හා බිබිලේ ආදී දිස්ත්රික්කයේ ඈත ප්‍රදේශවල ගොවීන් තම නිෂ්පාදනවලට ගබඩා පහසුකම් සඳහා ප්‍රතිලාභ ලබා නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ කන්න දෙකෙහිදී වී මෙට්රික් ටොන් 616,996 ක නිෂ්පාදනයක් වාර්තාකර තිබුණද අම්පාර දිස්ත්‍රික්කයේ ගොවීන් ඔවුන්ගේ නිෂ්පාදන සඳහා ගබඩා පහසුකම් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.